# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 අගෝස්තු මස 08 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.32 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජගත් අංගගේ | යූ.එල්.එන්.පී. උඩවෙල |
| අනුරුද්ධ ලේකම්ගේ | ජගත් කුමාර | රජිත හපුආරච්චිගේ |
| අසෝක රන්වල | ජගත් පී. විතාන | රවීන්ද්‍ර යසස් කුමානායක |
| අශෝක දයාරත්න | ජයන්ත ද සිල්වා | රවී විජේසේකර |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රොජර් සෙනෙවිරත්න |
| ඇන්ටනී උපුල් රාජිත | තුවාන් ආමිත් මොහමඩ් අක්රම් | රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | තෙබුවන පියනන්ද හිමි | රොයිස් විජිත |
| ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් | නිමල් ආර්. පීරිස් | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| ඊ.ඒ. නන්දන පත්මකුමාර | නිමල් චන්ද්‍රරත්න | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| උදාර රත්නායක | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලලන්ත ගුණසේකර |
| උපාලි කොඩිකාර | නිරෝෂන් පාදුක්ක | ලලිත් වර්ණකුමාර |
| උපාලි ගුණරත්න | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | විජිත් ප්‍රියන්ත |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| එම්.එස්.එම්. රහීම් | පී.ආර්.පී. අබේගුණවර්ධන | සරත් පතිරණ |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය | පී.ඩී. අබේරත්න | සිරිකමල් පිලීෂියන් ද සිල්වා |
| එස්. කුහවරදන් | ප්‍රදීප් උඩුගොඩ | සුනිල් වටගල |
| එස්.එම්. සකාවුල්ලා | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සුමිත් විජයමුණි ද සොයිසා |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | මහින්ද ජයසිංහ | සුසිල් කිඳෙල්පිටිය |
| කිත්සිරි කහටපිටිය | මහේෂ් අල්මේදා | සේනක දමයන්ත ද සිල්වා |
| කීර්ති කාරියවසම් | මංජුල ප්‍රසන්න සම්පත් | හරිස්චන්ද්‍ර කොස්තා |
| කේ.ඩී. අරුණ දීපාල් | මෙරිල් පෙරේරා | හෙක්ටර් බෙත්මගේ |
| කොලන්නගේ වජිර පෙරේරා | මොරිස් විජේරත්න | |
| චන්දන ජයකොඩි | මොහොමඩ් ෆයිරුස් | |

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනුරාධ විමලරත්න | ජනක දීපාල් වැලිවත්ත | ලයනල් ජයසිංහ |
| අමල් සිල්වා | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | ලලිත් එල්ලාවල |
| ඉන්දික බණ්ඩාර | නව්සර් ෆව්සි | ලෙනාඩ් කරුණාරත්න |
| උදේන විජේරත්න | නිරෝෂා අතුකෝරල මැතිනිය | සලෝචන ගමගේ |
| කාමල් කුරුප්පු | ප්‍රදීප් පෙරේරා | සහන් ප්‍රදීප් |
| කුරුසාමි කලන්කාඩි තේවර් | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සුසාර දිනාල් |
| කෝකිලා හර්ෂනි ගුණවර්ධන මැතිනිය | මංජුල බුද්ධදාස | සෙනල් වෙල්ගම |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | මොහොමඩ් ෆායිස් | ශිරන්ත අමරසේකර |
| | රන්දීර් රොද්‍රිගෝ | ශ්‍රීනාත් පෙරේරා |

## 01. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*"කොළඹ දිස්ත්‍රික් ලේකම්/දිසාපති/අතිරේක ලේකම් ස්වදේශ කටයුතු [කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය] විසින් අංක කො.දි.ලේ/ක්‍රි.සම්./24/දි.ස.ර./01/2017 හා 2017.07.14 දිනැති ලිපිය මගින් බස්නාහිර පළාත් සභා රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම් යොදා නොගැනීමට කටයුතු කරන මෙන් කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුවන් වෙත දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙතෙක් පනවනු ලැබ ඇති ප්‍රඥප්ති හා නීති නිසියාකාරයට ප්‍රකාශයට පත් කිරීමේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කර ඇති ගරු ආණ්ඩුකාරතුමා සභා සම්මත වූ ප්‍රඥප්ති සියලු සංශෝධනයන් ද ඇතුළත් වන පරිදි බාණ්ඩ වශයෙන් භාෂා ත්‍රයෙන් යුතුව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදන බව තමා වෙත දැනුම් දුන් බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදී.*

*iii*

*නිල වාර්තා නිවැරදි කිරීම :*

*"2017 ජූලි මස 04 වන දින නිල වාර්තාවේ (හැන්සාඩ්) 54 පිටුවේ, 1697 තීරු අංකයේ 07 වන පේළියේ ඇති 3(අ) යන්න, 3 (ආ) යන්න, (4), (8(1), 9(2), 24 ලෙස සඳහන්ව ඇති කොටස, 3 (අ) යන්න, 3 (ආ) යන්න, 6(4), (8(1), 9(2), 24 ලෙස නිවැරදි විය යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

***ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ද, රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා විසින් ද, ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමා විසින් ද ඉදිරිපත් කරන ලද සියලුම විගණකාධිපති වාර්තාවන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට දන්වන ලදී.***

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2017.07.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

අනතුරුව, 2017.07.18 දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව [කාරක සභාවේ සභාපති වෙනුවෙන්] රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලදී.

## 03. නොපැමිණ සිටීමේ අවසරය :

*"ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

## 04. රීති අංක 107 යටතේ යෝජනාව :

රීති අංක 107 යටතේ ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවට අදාළ රීති අත්හිටුවීමේ යෝජනාවට යූ. ජෝර්ජ් පෙරේරා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් විරෝධය පළ කළ හෙයින් බෙදීම් සීනුව නාද කිරීමෙන් අනතුරුව පළාත් සභාවේ බහුතරය ඊට එකඟ නොවූයෙන්, ගරු සභාපතිතුමා විසින් රීති අත්හිටුවීමේ යෝජනාව ඉවත් කරන ලදී.

***පූ.භා. 11.02 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ යසපාල කෝරළගේ මහතා ] මූලාසනාරූඪ විය.***

## 05. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලදුව, ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "දැඩි නියඟය අවසන්ව වැසි සමය ඉදිරියට එළඹෙනු ඇත. එහිදී දැඩි වර්ෂාවෙන් ඇති විය හැකි ගංවතුර තත්වයන් පාලනය කිරීමට පෙර සූදානමක් ඇතිව කටයුතු කළහොත් මහජනයාට විය හැකි ආපදා අවම කර ගත හැකිවා මෙන්ම රජයට වන වියදම් රාශියක් ද අඩු කර ගත හැකි වනු ඇත. එබැවින් මේ වන විට පහසුවෙන් පිරිසිදු කළ හැකි ඇළ මාර්ග සියල්ල පළාත් පාලන ආයතන මඟින් පිරිසිදු කරවා අනවසර ඉදිකිරීම් ඇත්නම් ඉවත් කරවා එකී ඇළ මාර්ග රක්ෂිතයන් සලකුණු කර මහජන පීඩාවන් අවම කර ගැනීමට දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් දියත් කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II

අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "බස්නාහිර පළාත තුළ කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කයන්හි පිහිටි බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව දෙදහසකට අධික වන අතර, මෙම සෑම විහාරස්ථානයකම ඉරුදින පෙරවරු දහම් පාසල් පවත්වාගෙන යනු ලබයි. එහෙත් සති අග ඉරු දින හා පෝය නිවාඩු දිනවල පෞද්ගලික පන්ති පැවැත්වීමෙන් දරුවන් විශාල සංඛ්‍යාවක් පෞද්ගලික පන්ති කරා යොමු වන බැවින් දහම් පාසල් නොපැමිණෙන බව දිස්ත්‍රික් ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා පවසති. දැනටමත් සබරගමුව සහ මධ්‍යම පළාත් තුළ ඉරු දින පස්වරු 1.00 දක්වා පෞද්ගලික පන්ති පැවැත්වීම එම පළාත් සභාවන් විසින් අත්හිටුවා ඇත.*

*මෙම තත්ත්වය තුළ බස්නාහිර පළාත තුළ ඉරු දින හා පෝය නිවාඩු දිනවල පස්වරු 1.00 දක්වා පෞද්ගලික පන්ති පැවැත්වීම වැළැක්වීම සඳහා නීති සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.30 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ යසපාල කෝරළගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තැබීමේ යෝජනාව :

රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"දැන් මෙම සභාව කල් තැබිය යුතු ය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30(1) යටතේ ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා ගරු අමාත්‍යතුමා විසින් කල් ගන්නා ලදී.*

## 08. කල් තැබීම :

අනතුරුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් [ සිරිකමල් පිලිෂියන් ද සිල්වා ] පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.59 ට, 2017 අගෝස්තු මස 22 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.08.08
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/08
Minuts 2017.08.08- Hansard Section